# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2505/16 - 2026 සැප්තැම්බර් මස 07 වැනි සඳුදා - 2026.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ**

**ජා-ඇල නගර සභාවේ**

**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ජා-ඇල නගර සභාවේ තෝරා පත් කරගනු ලැබ ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ ජා-ඇල නගර සභාව සඳහා තෝරා පත් කරගනු ලැබ ඇති සභිකයෙකු ලෙස පත්වූ හෙට්ටිආරච්චිගේ කරුනාජීව තිසේරා මහතා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ජා-ඇල නගර සභාව සඳහා තෝරා පත්විය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඇත්මඩලගේ බෙනිසස් විජිත පෙරේරා මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ජා-ඇල නගර සභාවේ තේරීම්භාර නිලධාරි විතාන අප්පුහාමිලාගේ රවීන්ද්‍ර වික්‍රමසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ඇත්මඩලගේ බෙනිසස් විජිත පෙරේරා මහතා, ජා-ඇල නගර සභාවේ තෝරා පත් කරගනු ලැබ ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ,**
තේරීම්භාර නිලධාරි,
ජා-ඇල නගර සභාව.

2026 සැප්තැම්බර් මස 07 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය.
ගම්පහ.

EOG 09 - 0184

1A - PG 7963 — 04 (2026/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*